# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

**අංක 1866/32 – 2014 ජුනි 11 වැනි බදාදා – 2014.06.11**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් වන මම, මෙයින් ප්‍රකාශ කරමි.

මධ්‍යම පළාතේ මහනුවර දිස්ත්‍රික්කයේ හතරලියද්ද ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, පල්ලේ පළාත කෝරළේ සුළු කොට්ඨාසයේ හතරලියද්ද ගමේ පිහිටි සර්වේයර් ජනරාල්ගේ අංක මහ/එච්ටීආර්/2013/1502 හා 2013.08.13 දිනැති ප්‍රගමන අනුරේඛනයේ ප්‍රමාණයෙන් හෙක්. 1.0803 ක් පමණ වූ පහත සඳහන් ඉඩම් කොටසට මායිම්:

01. **කැබලි අක්ෂර 'ඒ' – අස්වැද්දුම කුඹුර – ප්‍රමාණය: හෙක්. 1.0803 ක් පමණ**

උතුරට: මාර්ගය (මා.සං.අ.), එල්. බී. අත්තනායක හිමිකම් කියන අස්වැද්දුම කුඹුර සහ නාගරික සංවර්ධන අධිකාරිය හිමිකම් කියන අස්වැද්දුම කුඹුර; නැගෙනහිරට: පොල්වත්තේ ඇළ සහ රඹුක්කන ඔය; දකුණට: පොල්වත්තේ ඇළ, රඹුක්කන ඔය සහ චන්ද්‍රා සෙනෙවිරත්න හිමිකම් කියන අස්වැද්දුම කුඹුර; බටහිරට: චන්ද්‍රා සෙනෙවිරත්න හිමිකම් කියන අස්වැද්දුම කුඹුර සහ මාර්ගය (මා.සං.අ.).

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය.

මගේ අංකය: එල්ඩී/05/2013/යූඩීඒ/373.
2014 අප්‍රේල් 09 වැනි දින,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,
'මිහිකත මැදුර', ඉඩම් මහ ලේකම් කාර්යාලය,
1200/6, රජමල්වත්ත පටුමග,
බත්තරමුල්ල.

06 - 748

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් වන මම, මෙයින් ප්‍රකාශ කරමි.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, මහරගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, තලපත්පිටිය ගමේ පිහිටි කොළඹ දිස්ත්‍රික් මිනින්දෝරු අධිකාරී විසින් පිළියෙල කරන ලද අංක සීඕ/එම්එච්ආර්/2012/929 හා 2012.11.30 දිනැති ප්‍රගමන අනුරේඛනයේ කැබලි අංක 1 වශයෙන් පෙන්නුම් කර ඇති දෙල්ගහවත්ත නමැති ප්‍රමාණයෙන් හෙක්. 0.1361 ක් පමණ වූ පහත සඳහන් මායිම් තුළ පිහිටි ඉඩම් කොටස:

01. **කැබලි අංක 1 – දෙල්ගහවත්ත – ප්‍රමාණය: හෙක්. 0.1361 ක් පමණ**

උතුරට: තලපත්පිටිය පාරේ වරි. අංක 79/1, 79/2 දරන ඉඩම් සහ බප/ජය උඩහමුල්ල සිද්ධාර්ථ විද්‍යාලයේ ක්‍රීඩා පිටිය; නැගෙනහිරට: බප/ජය උඩහමුල්ල සිද්ධාර්ථ විද්‍යාලයේ ක්‍රීඩා පිටිය; දකුණට: බප/ජය උඩහමුල්ල සිද්ධාර්ථ විද්‍යාලයේ ක්‍රීඩා පිටිය සහ තලපත්පිටිය පාර; බටහිරට: තලපත්පිටිය පාර සහ තලපත්පිටිය පාරේ වරි. අංක 79/1, 79/2 දරන ඉඩම්.

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය.

යොමු අංකය: 4-3/8/2012/පීසී/63.
2014 ජනවාරි මස 06 වැනි දින,
අංක 1200/6,
"මිහිකත මැදුර",
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

06 - 749



සැ.යු.– මෙම ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් වන මම, මෙයින් ප්‍රකාශ කරමි.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, මහරගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ගංගොඩවිල (මහරගම මහනගර සභා සීමාව තුළ) යන ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක සීඕ/එම්එච්ආර්/2013/1088 හා 2013.12.12 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සවිස්තරව දැක්වෙන පහත සඳහන් නමින් හා ප්‍රමාණයෙන් යුත් ඉඩම් කැබැල්ලට මායිම්:

01. **කැබලි අක්ෂර 'ඒ' – හේමවිමන, දවටගහලන්ද නොහොත් දවටගහවත්ත (ශ්‍රී සෝරත මාවතේ, වරි. අංක 113, 115 සහ 117 දරන ඉඩමේ කොටසක්) – ප්‍රමාණය: හෙක්. 0.4239 ක් පමණ**

උතුරට: ශ්‍රී සෝරත මාවත සහ මාර්ගය; නැගෙනහිරට: මාර්ගය සහ හේමවිමන, දවටගහලන්ද නොහොත් දවටගහවත්ත (ශ්‍රී සෝරත මාවතේ වරි. අංක 113, 115 සහ 117 දරන ඉඩමේ කොටසක්); දකුණට: හේමවිමන, දවටගහලන්ද නොහොත් දවටගහවත්ත (ශ්‍රී සෝරත මාවතේ වරි. අංක 113, 115 සහ 117 දරන ඉඩමේ කොටසක්) එගොඩවත්ත පාරේ වරි. අංක 138/2 දරන ඉඩම, එස්. ඒ. නලින් කුමාර හිමිකම් කියන වරි. අංක සොයාගත නොහැකි ඉඩම, එගොඩවත්ත පාරේ වරි. අංක 138 දරන ඉඩම සහ එගොඩවත්ත පාර; බටහිරට: එගොඩවත්ත පාර සහ ශ්‍රී සෝරත මාවත.

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය.

මගේ අංකය: 4/3/13/2013/ඊ /584.
2014 මැයි මස 09 වැනි දින,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,
අංක 1200/6,
"මිහිකත මැදුර",
ඉඩම් මහලේකම් කාර්යාලය,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.
06 - 750

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.